**ඉන්දීය අග්‍රාමාත්‍යතුමා සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතර දුරකථන සාකච්ඡාව**

ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා අද දින ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත දුරකථන ඇමතුමක් ලබා දෙමින් ඊයේ දින පාර්ලිමේන්තු මැතිවරණය සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් සිය සුභපැතුම් පිරිනැමීය. ඉන්දීය අග්‍රාමාත්‍යතුමා කොවිඩ් වසංගතයේ අභියෝග හමුවේ වුවද මැතිවරණය සාර්ථකව සංවිධානය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රජය සහ මැතිවරණයට සම්බන්ධ ආයතන වෙත සිය ප්‍රශංසාව පළ කළේය. එසේම, එතුමා මැතිවරණයට උද්යෝගීව සහභාගී වූ ශ්‍රී ලාංකික ජනතාව වෙත සිය ප්‍රසාදය පළ කළ අතර එය දෙරටටම පොදු ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් පිළිඹිබු කළ බව ප්‍රකාශ කළේය.
අග්‍රාමාත්‍ය ශ්‍රී මෝදි මැතිතුමා නිකුත් වෙමින් පවතින ඡන්ද ප්‍රතිඵල වලින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විශිෂ්ට ලෙස ජයග්‍රහණය කර තිබෙන බව පෙනීයන බව පැවසූ අතර ඒ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට සිය සුභාසිංශන පිරිනැමීය.

පෙර ඔවුන් අතර පැවති සුහද සහ ඵලදායි අන්තර්ක්‍රියා සිහිපත් කරමින් නායකයන් දෙපළම දිගුකාලීන සහ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පැතිර තිබෙන ඉන්දියා - ශ්‍රී ලංකා සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට වන කැපවීම අවධාරණය කළේය. එසේම, ද්විපාර්ශවික සහයෝගීතාවයේ සියලු අංශයන්හි කඩිනම් ප්‍රගතියෙහි වැදගත්කම නායකයන් දෙපළ විසින් අවධාරණය කරන ලදී.

ඉන්දියාවේ බෞද්ධ වන්දනා නගරයක් වන කුෂිනගර්හි ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ඉදිකර තිබෙන බව ඉන්දීය අග්‍රාමාත්‍යතුමා අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට දැනුම් දුන් අතර කුෂිනගර් නුදුරේදීම ශ්‍රී ලංකාවෙන් සංචාරකයන් පිළිගැනීමට අපේක්ෂාවෙන් සිටින බව ප්‍රකාශ කළේය.

නායකයන් දෙපළ කොවිඩ් 19 වසංගතය විසින් මතුකර තිබෙන අභියෝගයන්ට මුහුණ දීම සම්බන්ධයෙන් සමීපව කටයුතු කිරීමට ද ඉදිරියේදී ද්විපාර්ශවික සබඳතා තවදුරටත් ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමටද එකඟ විය.

නව දිල්ලිය
2020 අගෝස්තු 06